# ගැණුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026

## ප්‍රතිචක්‍රීකරණය කළහැකි ඝණ අපද්‍රව්‍ය අලෙවිය හා ඉදුල් ( සත්ව ආහාර ) ,සත්ව අපද්‍රව්‍ය ( මාළු අපද්‍රව්‍ය )

## අලෙවිය සඳහා මිල ගණන් කැඳවීමේ කොන්දේසි

01. මෙම කාර්යය සඳහා ව්‍යාපාරය ලියාපදිංචි වී තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

02. සභාව සතු මිනුම් උපකරණ භාවිතා කර භාණ්ඩ මිල දී ගැනීමට එකඟ විය යුතුය.

03. භාණ්ඩ මිලදී ගත් පසු එම අවස්ථාවේදීම සභාව වෙත අදාල ගාස්තු ගෙවීම කළ යුතුය.

04. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී වැට් සහ අනෙකුත් බදු මුදල් රහිතව ඉදිරිපත් කල යුතු අතර රජයේ බදු මුදල් ඔබ විසින් ගෙවිය යුතු වේ.

05. බඩු මිලදී ගත් දිනයේම ඒවා අප පරිශ්‍රයෙන් ඉවත් කරගත යුතුය.

06. භාණ්ඩ ලබාගත් පසු ඒවායේ අනවශ්‍ය කොටස් පවතී නම් ඒවා ද අනිවාර්යයෙන් ම රැගෙන යා යුතුයි.

07. ඉදිරිපත් වන ටෙන්ඩර් අතුරින් එකක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ටෙන්ඩර් කමිටුව සතු වේ .

08. වෙළඳපල තුළ අදාල මිල ගණන් වෙනස් වූවත් ගිවිසුම් ගත කාලසීමාව තුල දී ගිවිසුම් ගත මිල ගණන් වලට අනුව පමණක් භාණ්ඩ ලබා ගැනීමට ඔබ බැඳී සිටිය යුතුය.

09. ආපසු ගෙවනු නොලබන රු.2000.00 ක ටෙන්ඩර් ගාස්තු සහ ආපසු ගෙවන රු.2500.00 ක ටෙන්ඩර් තැම්පතුව මෙම කාර්යාලයට ගෙවා ටෙන්ඩර් කොන්දේසි සමඟ ටෙන්ඩර් ආකෘති පත්‍ර මිලදී ගත හැක.

10. නගර සභාව විසින් ටෙන්ඩර්ගත භාණ්ඩ මිලදී ගන්නා ලෙස ටෙන්ඩර්කරු දැනුවත් කල දිනයේ සිට අදාල මිලදී ගැනීම් සිදුකර භාණ්ඩ නගර සභා පරිශ්‍රයෙන් දින 07 ක් ඇතුලත ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට ටෙන්ඩර්කරු බැඳී සිටී.

11. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘතිපත්‍ර වල මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සටහන් කර ඒවා වෙන වෙනම කවර වල බහා , නැවත එක් කවරයක බහා , එහි වම්පස ඉහල කෙලවරේ ඝණ අපද්‍රව්‍ය , ඉදුල් ( සත්ත්ව ආහාර ) හා සත්ත්ව අපද්‍රව්‍ය ( මාළු අපද්‍රව්‍ය ) විකිණීම සඳහා මිල ගණන් කැඳවීම - 2026 යනුවෙන් සඳහන් කර කාර්යාලයීය ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

12. මෙම කොන්දේසි 2026-01-01 වන දින සිට 2026-12-31 වන දින දක්වා වලංගු වේ .

13. සියළුම ටෙන්ඩර් පිළිගැනීම හෝ ප්‍රතික්ශේප කිරීමේ අයිතිය සහ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ගන්නා වූ අවසාන තීරණය පානදුර නගර සභාව සතු වේ .

14. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් කාර්යාල වේලාවන් තුල මෙම කාර්යාලයට පැමිණ හෝ දුරකථන අංක 038- 2232275 , දිගුව 214 (සෞඛ්‍ය අංශය )මගින් විමසීම් කළ හැකිය .